**හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 17 - 2022**

**-----------------------------------------------------------------------------**

**1. විගණන මතය**

1.1 හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 17 හි 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 2023 ජූනි 27 දින වන විට 2022 වර්ෂයට අදාළව හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 17 කට අදාළව විගණන වාර්තා නිකුත් කර තිබුණු අතර එම වාර්තාවල කාරක සභා 03 ක් සඳහා අහිතකර මතයක් සහ කාරක සභා 14 ක් සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කිරීම සඳහා හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 05 ක සමාලෝචිත වර්ෂය සඳහා වූ ස්ථාවර තැන්පතු පොලී ආදායම් රු.1,228,493 ක් අඩුවෙන් සහ අම්බලන්තොට ගොවිජන සේවා කාරක සභාවේ ස්ථාවර තැන්පතු ශේෂය රු.1,148,902 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | මෙම දෝෂයන් 2023 වර්ෂයේ ගිණුම් වාර්තා වල නිවැරදිව දැක්වීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම් වර්ෂයට අදාළ සියලු ආදායම් හඳුනාගැනීමට සහ මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණ හා නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 05 ක සමාලෝචිත වර්ෂයට අදාළ විවිධ විෂයන්ට අයත් වියදම් රු.398,309 ක් වැඩියෙන් සහ රු.192,990 ක් අඩුවෙන්ද ගොවිජන සේවා කාරක සභා 09 ක විවිධ විෂයන්ට අදාළ ආදායම් රු.2,785,213 ක් අඩුවෙන් සහ රු.3,859,210 ක් වැඩියෙන්ද, ගොවිජන සේවා කාරක සභා 09 ක ජංගම වත්කම් රු.973,627 ක් අඩුවෙන් සහ රු.1,515,825 ක් වැඩියෙන්ද, ගොවිජන සේවා කාරක සභා 07 ක ජංගම වගකීම් රු.28,816,544 ක් අඩුවෙන් සහ රු.1,993,160 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි. | මෙම දෝෂයන් 2023 වර්ෂයේ ගිණුම් වාර්තා වල නිවැරදිව දැක්වීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම් වර්ෂයට අදාළ ආදායම් හා වියදම් ගැලපීමටත්, මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණව හා නිවැරදිව ඉදිරිපත් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 04 ක ස්ථාවර වත්කම් වටිනාකම රු.35,372,578 ක් අඩුවෙන් සහ රු.2,399,449 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු අතර කාරක සභාව පිහිටි ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | මධ්‍යස්ථාන 04 ක ඉඩම් පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව හා අනෙකුත් දෝෂයන් 2023 වර්ෂයේ ගිණුම් වාර්තාවල නිවැරදිව දැක්වීමට කටයුතු කරන බව. | කාරක සභාවට අයත් සියලු වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතු අතර මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණව හා නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 04 ක ගිණුම් විෂයන් 09 කට අදාලව මූල්‍ය ප්‍රකාශන හා අනුරූපී වාර්තා අතර ශේෂවල රු.1,244,560 ක නොසැසඳීම් පැවතුණි. | 2023 ගිණුම් වාර්තාවල නිවැරදි කර දැක්වීමට කටයුතු කරමි. | ගිණුම් නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.3.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අම්බලන්තොට ගොවිජන සේවා කාරක සභාව විසින් පොහොර ජංගම ගිණුමෙන් රු. 623,795 ක් බාහිර කොන්ත්‍රාත්කරුවෙකු වෙත ණය පදනම ලබාදී තිබුණු අතර ගොවිජන සේවා කාරක සභා 02 ක් විසින් රු. 667,486 ක් බාහිර කොන්ත්‍රාත්කරුවෙකු සහ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වෙත ගෙවා තිබුණි. | මෙම මුදල් නැවත කමිටුව වෙත ලැබී ඇති අතර ගිණුම් අතර පියවීමට හා ආවරණ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇති බව. | ගොවිජන සේවා කොමසාරිස්ගේ 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන චක්‍රලේඛය 10 ඡේදයේ සඳහන් අනුමත ගෙවීම් පමණක් සිදුකළ යුතුය. |

### 1.3.4 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 13 ක වත්කම් රු.46,948,556 ක් වූ වත්කම් වලට අදාලව සවිස්තරාත්මක උපලේඛන, භාණ්ඩ සමීක්ෂණ වාර්තා, බැංකු ප්‍රකාශන, ශේෂ සනාථන ලිපි, බැංකු පාස්පොත්, කාල විශ්ලේෂණ, ස්ථාවර වත්කම් ලේඛන සහ ණය ලේඛනද ගොවිජන සේවා කාරක සභා 04 කට අදාළ රු.2,199,768 ක් වූ වගකීම් සඳහා ශේෂ සනාථන ලිපි, සවිස්තරාත්මක සටහන් සහ ණයහිමි කාල විශ්ලේෂණය සහ ගොවිජන සේවා කාරක සභා 02 ක රු.916,923 ක් වූ ආදායම් වියදම් ගණුදෙනු සනාථ කිරීමට අදාළ තොරතුරු, ඇස්තමේන්තු හා ගෙවීම් වාර්තා මිනුම් පත් ද විගණනයට ඉදිරිපත් නොකෙරුණු බැවින් එම ගිණුම් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය සහ සත්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | 2023 ගිණුම් වාර්තාවල නිවැරදිව තොරතුරු ඉදිරිපත් කිරීමට අවශ්‍ය සටහන්, වාර්තා, ලේඛන ඇතුලත් කරන ලෙස ප්‍රාදේශීය නිලධාරීන්ට ලිඛිතව උපදෙස් ලබාදීමට කටයුතු කරමි. | ආදායම් වියදම් සනාථ කිරීම හා වත්කම් සහ වගකීම් ශේෂ තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත -------------------------- | | | |
| i. 51(1) වගන්තිය | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් යම් ප්‍රදේශයක් සඳහා ගොවිජන සංවර්ධන සභාවක් ස්ථාපනය කිරීමට ක්‍රියාකළ යුතු වුවද ගොවිජන සේවා කාරක සභා 17 ක ගොවිජන සංවර්ධන සභා පිහිටුවා නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙතින් උපදෙස් ලැබී නොමැති අතර ඒ සඳහා උපදෙස් ලද වහාම ගොවිජන සංවර්ධන සභා පිහිටුවීමට කටයුතු කරන බව. | පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ii. 56(3) හා (4) වගන්ති | ගොවිජන සේවා කාරක සභා 06 ක වගකිව යුතු නිලධාරීන් විසින් සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. 961,956 වූ හිඟ අක්කර බදු අයකර ගෙන නොතිබුණි. | හිඟ අක්කර බදු අයකර ගැනීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව. | පනතෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය --------------------------- | | | |
| i. මුදල් රෙගුලාසි 110 | ගොවිජන සේවා කාරක සභා 12 ක හානි හා පාඩු සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | හානි හා පාඩු ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කරමි. | ලේඛන යාවත්කාලීනව පවත්වාගත යුතුය. |
| ii. මුදල් රෙගුලාසි 133 හා 134 | ගොවිජන සේවා කාරක සභා 04 ක අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ඉදිරියේදී විගණනයක් සිදුකිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| iii. මුදල් රෙගුලාසි 237(ආ) | ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී භාණ්ඩ ලැබී ඇති බවට තහවුරු කරමින්, අදාල බඩු තොග පොතට ඇතුලත් කර ඇති බවට සඳහන් කල යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී සිදුකර තිබුණු රු.1,096,408 ක මිලදීගැනීම් සම්බන්ධයෙන් ගොවිජන සේවා කාරක සභා 04 ක් අදාළ පරිදි කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| iv. මුදල් රෙගුලාසි 245 හා 257 | ලුණම ගොවිජන සේවා කාරක සභාව විසින් 2022 දෙසැම්බර් 30 දින ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලයට ගෙවා තිබුණු අංක 284 දරන රු.59,899,000 ක් වූ ගෙවීම් වවුචරය අනුමත කර හා සහතික කර නොතිබුණි. | අතපසු වීමක් බව හා ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| v. මුදල් රෙගුලාසි 272 (3) | සහතික කරන ලද සියලුම වවුචර් පත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, අඟුණුකොළපැලැස්ස ගොවිජන සේවා කාරක සභාව විසින් වටිනාකම රු. 125,919,919 ක් වූ වවුචර් පත් 3 ක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | විගණන අවස්ථාවේදී වවුචර්පත් සහතික කිරීම සඳහා ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත යවා ඇති අතර පසුව විගණනයට ඉදිරිපත් කරන ලද බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| vi. මුදල් රෙගුලාසි 396(ඈ) | අම්බලන්තොට ගොවිජන සේවා කාරක සභාව විසින් නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ කල් ඉකුත් වූ එකතුව රු. 156,623 ක් වූ චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්ගේ උපදෙස් පරිදි කටයුතු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| vii. මුදල් රෙගුලාසි 454 (2) | ගොවිජන සේවා කාරක සභා 05 ක විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | මේ වන විට ලේඛන ආරම්භ කර පවත්වාගෙන යන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| viii. මුදල් රෙගුලාසි 754 | ලුණම ගොවිජන සේවා කාරක සභාව විසින් වර්ෂය අවසානයේදී බඩු ලේඛන පොත යාවත්කාලීන කර නොතිබුණි. | මේ වන විට යාවත්කාලීන කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ix. මුදල් රෙගුලාසි 756 | ගොවිජන සේවා කාරක සභා 04 ක් විසින් 2022 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. | මේ වන විට භාණ්ඩ සමීක්ෂණය සිදුකර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) ගොවිජන සේවා කොමසාරිස්ගේ 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන චක්‍රලේඛය<br>--------------------------- | | | |
| i. 03 (ඉ) වගන්තිය | සියළුම ගනුදෙනු නියමිත ගිණුම් පොත්වල ක්‍රමවත්ව සහ කලට වේලාවට ඇතුළත් කළ යුතු වුවද කටුවන ගොවිජන සේවා කාරක සභාව විසින් එසේ කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ක්‍රමවත්ව කලට වේලාවට ගිණුම් පොත්වල සටහන් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii. 17(3) ඡේදය | වියදම් සහතික කරන නිලධාරියා විසින් වවුචර්පත් අත්සන් තැබිය යුතු වුවද, ගොවිජන සේවා කාරක සභා 02 ක එකතුව රු.315,664 ක්වූ වවුචර්පත් 10 ක් සහතික කර නොතිබුණි. | අත්සන් නොකරන ලද වවුචර්පත් අත්සන් කර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| iii. 30 (1) ඡේදය | කාරක සභාව සතු තොග, මුදල්, බඩු බාහිරාදිය සහ වෙනත් සියළුම ස්පෘශ්‍ය වත්කම් ලේකම්වරයා විසින් මුදල් වර්ෂය අවසානයේදී අඩු වශයෙන් කාරක සභාවේ එක් සාමාජිකයකු ඇතුළත්ව පරීක්ෂා කර බලා සහතික කළයුතු වුවද, ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින් සහතික කර අත්සන් තබා නොතිබුණි. | වර්ෂය අවසානයේ තොග අගය කර ඇත. අත්සන් කිරීමට මඟහැරුණු අවස්ථා සොයා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| iv. 30 (4) ඡේදය | කාරක සභාව සතු ගොඩනැගිලිවල මූලික වටිනාකමින් වාර්ෂිකව සියයට 5ක් බැගින් ක්ෂය කළයුතු වුවද, බඳගිරිය ගොවිජන සේවා කාරක සභාව විසින් හීනවන ශේෂ ක්‍රමයට සියයට 5ක් බැගින් ක්ෂය කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2022 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 15 ක එකතුව රු.10,169,811 ක අතිරික්තයක්ද, ගොවිජන සේවා කාරක සභා 02 ක එකතුව රු. 157,188 ක ඌනතාවයක්ද ගොවිජන බැංකු 17 ක එකතුව රු. 5,847,613 ක ශුද්ධ ලාභයක්ද, විය. 2021 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 14 ක එකතුව රු. 11,974,993 ක වූ අතිරික්තයක්ද, ගොවිජන සේවා කාරක සභා 03 ක එකතුව රු. 1,503,995 ක ඌනතාවයක්ද, ගොවිජන බැංකු 17 ක එකතුව රු. 3,900,344 ක් වූ ශුද්ධ ලාභයක් ද විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මුදල් කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගොවිජන සේවා කාරක සභා 03 ක කම්ටු හා පොහොර ගිණුම්වලට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පවතින එකතුව රු.1,127,269 ක් වූ තැන්පත් කළ නමුත් නිෂ්කාශණය නොවූ චෙක්පත් හා ජංගම ගිණුමට සෘජුව බැරවූ මුදල් ශේෂ සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරන බව. | බැංකු සැසඳුම්වල ඉදිරියට ගෙන එන ශේෂයන් නිරවුල් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 06 ක බැංකු ජංගම සහ ඉතිරිකිරීමේ ගිණුම් 09 ක දීර්ඝ කාලයක සිට අක්‍රියව පවතින ශේෂවල එකතුව රු.16,262,180 ක් විය. මෙම මුදල් වඩාත් ඵලදායී ආයෝජනයක යෙදවීමෙන් ආදායම වැඩිකරගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයෝජනය කිරීමට කටයුතු කරන බව. | මුදල් වඩාත් ඵලදායී ආයෝජනයක යෙදවීමෙන් ආදායම වැඩි කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා බල ප්‍රදේශයේ සුළු වාරිමාර්ග වැව්වල ජල ධාරිතාවය මැනීම සඳහා ලබාදී තිබුණු ජල උස මාපක 65 ක් ගොවිජන සේවා කාරක සභා 05 ක් විසින් අදාළ අරමුණු සඳහා යොදවා නොතිබුණි. | මෙම උපකරණ සුළු වාර්මාර්ග වැව්වල ජල ධාරිතාව මැනීමට නිකුත් කරන බව. | අදාළ කාර්ය සඳහා භාවිතා කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 05 ක් විසින් 2021/2022 මහ කන්නයේ හා 2022/2023 මහ කන්නයේ පරිසර හිතකාමී කාබනික පොහොර නොමිලේ බෙදා හැරීමේ වැඩසටහන් යටතේ ගොවීන් වෙත බෙදා හැරීමට රජය විසින් ලබාදී තිබුණු රු.17,815,662 ක් වටිනා පොහොර තොග ගොවීන් වෙත නිකුත් නොකර රඳවාගෙන තිබුණි. | සැපයුම්කාර ආයතන වෙත නැවත මෙම පොහොර තොග යැවීමට කටයුතු කරන බව. | අවශ්‍ය ප්‍රමාණයන් ඇණවුම් කළ යුතු අතර එම තොග නිවැරදිව බෙදා හැරීම කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පිරිවැය රු. 329,137 ක කල් ඉකුත් වූ කෘෂි රසායන, එළවළු බීජ, බිත්තර වී සහ රසායනික පොහොර තොග සම්බන්ධයෙන් ගොවිජන සේවා කාරක සභා 02 ක් විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | තොග කපා හැරීම සඳහා සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ඉල්ලීම් කර ඇති බව. | කල් ඉකුත් වීමට පෙර විකිණීමට හෝ ආපසු යැවීමට කටයුතු කළ යුතු අතර, එසේ කටයුතු නොකළ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 08 කට අයත් ගොවිජන සංවර්ධන නිලධාරී නිවාස 08 ක්, | ගොවිජන සංවර්ධන නිලධාරී නිවාසයන් සහ | භාවිතයට ගතහැකි වත්කම් හා උපකරණ |

| | | |
|---|---|---|
| අලෙවිසැල් 04 ක්, සීසීටීවී කැමරා පද්ධති 02 ක්, පැරණි පොහොර ගබඩාවක්, කාබනික පොහොර නිෂ්පාදන යන්ත්‍ර 02 ක්, ගොයම් කපන යන්ත්‍රයක්, යතුරු පැදියක්, තණකොළ කපන යන්ත්‍රයක්, ෆැක්ස් යන්ත්‍රයක් නිශ්කාර්යව පැවතුණි. | පොහොර ගබඩා අලුත්වැඩියා කිරීම සඳහා කාරක සභාව සතුව ප්‍රමාණවත් මුදල් නොමැති බැවින් අලුත්වැඩියා කිරීම සඳහා වියදම් ඇස්තමේන්තු සහ ප්‍රතිපාදන හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයෙන් ඉල්ලීම් කර ඇති බව හා අනෙකුත් වත්කම් අවශ්‍යතාවය අනුව අලුත්වැඩියා කිරීමට උපදෙස් ලබාදෙන බව. | උපයෝජනයට ගැනීමටත් අනිකුත් වත්කම් හා උපකරණ අපහරණය කිරීමටත් කටයුතු කළ යුතුය. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 02 ක් විසින් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.3.2 වගන්තියට පටහැනිව රු. 734,160 ක බිත්තර වී, කාබනික පොහොර හා කාර්යාල උපකරණ මිලට ගෙන තිබුණි. | ඉදිරියේදී මෙම දෝෂයන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 05 කට අයත් වසම් 48 ක් සඳහා කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන්ගේ පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු වසම් සඳහා වැඩ බැලීමේ පත්වීම් ලබා දීමට කටයුතු කර ඇති බව. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

**4. ගොවිජන බැංකු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවි බැංකු 10 මගින් ගොවීන් වෙත ලබාදී තිබුණු ණය වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු. 10,859,354 ක අක්‍රිය ණය ශේෂය සහ පොලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය මුදල් හා පොලී අයකර ගැනීම සඳහා ගොවිජන විනිශ්චය සභා තීරණය අනුව නඩු පැවරීමට කටයුතු කරන බව. | හිඟ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නෙටොල්පිටිය ගොවිජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති භෞතිකව නිරීක්ෂණනය නොවූ රු.912,063 ක අත ඉතිරි ශේෂය හා රු.130,404 ක් වූ අවිනිශ්චිත ගිණුම නිරවුල් කර නොතිබුණි. | කමිටු ලිපිකරු විසින් 1999 සිට 2006 දක්වා සිදුකරන ලද වැරද්දක් බව හා එම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ශේෂයන් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතුය. |